# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/37 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 38 වන වගන්තිය සමඟ කියවිය යුතු 20(3) වන වගන්තිය යටතේ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රොෂාන් රණසිංහ (පා.ම),
වාරිමාර්ග අමාත්‍ය.

2023 ජනවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

#### නියෝග

1. මෙම නියෝග අභියාචන මණ්ඩලය නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉංජිනේරු සභාව විසින් පනතේ 16(5) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන තීරණ වලට එරෙහි අභියාචනා භාරගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අභියාචන මණ්ඩලයට බලය පැවරී ඇත.

3. පනතේ 16 (5) වන වගන්තිය යටතේ තීන්දුවකට එරෙහි අභියාචනයක් විභාග කිරීමට තීන්දුවක් ලැබීමෙන් දින තිහක් (30) තුළ ඒ අභියාචනය යොමු කිරීම හෝ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

4. ඉංජිනේරු සභාව විසින් ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් සලකා බලන කාලය තුළ දී හෝ විනය පරීක්ෂණ කාර්ය පටිපාටියේ දී ස්වාභාවික යුක්තියේ මූලධර්ම කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් පවතින්නේ ද නැද්ද යන්න සලකා බැලීම පිණිස අභියාචන මණ්ඩලය පිහිටුවා ඇත.

5. ඉංජිනේරු සභාව විසින්, අභියාචන මණ්ඩලයේ පෙනී සිටීම කරගෙන යාමට සහ ඔවුන්ගේ කාර්යයන් අඛණ්ඩව කරගෙන යාමට ඔවුන්ට පහසුකම් සැලැස්වීමට සැලසුම් සකස් කළ යුතු ය.

6. අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයාට අවශ්‍ය ලිපිකරු කාර්ය මණ්ඩලය සභාවේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවීමෙන් ලබාගත හැක.

1A - G 38847 — 12 (2023/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. අභියාචනයක් ඉදිරිපත් කරන හෝ යොමු කරන අවස්ථාවක දී අභියාචන මණ්ඩලය විසින්, අභියාචන මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින දිනය වේලාව සහ ස්ථානය නිශ්චිතව දක්වමින් ඔවුන්ගේ නියෝජිතයන් වේ නම් ඔවුන් සමඟ අභියාචන මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින ලෙසට සියලු පාර්ශව වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යවනු ලැබිය යුතු ය.

8. පළමුව පෙනී සිටින දිනයේ, අභියාචන මණ්ඩලය විසින්, පළමුව පෙනී සිටින දින සිට සති හතරක කාලයක් තුළ ඔවුන්ගේ ලිඛිත නීතිමය දේශනා ඉදිරිපත් කරන ලෙසට ඒ පාර්ශවයන්ට දැනුම්දිය යුතු ය.

9. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ පැමිණිලි ලේකම්වරයාට අභියාචනයක දී නීතිඥවරයෙකුගේ සහය ඇතිව හෝ නොමැතිව සභාව නියෝජනය කිරීමට අවසරය හිමි වේ.

10. සියලු පාර්ශවවල ලිඛිත දේශනා ඉදිරිපත් කිරීමෙන් පසුව අභියාචන මණ්ඩලය විසින්, වාචික විවාදයක් අවශ්‍යයයි සිතන්නේනම්, වාචික විවාදයක් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කළ යුතු ය.

11. ලිඛිත සහ වාචික දේශන සලකා බැලීමෙන් පසුව අභියාචන මණ්ඩලය විසින් නියෝගයක් සඳහා අභියාචනය සලකා බැලිය යුතු අතර මෙම නියෝගවල අංක 14 (i) හෝ 14 (ii) විධාන කළ නියෝග ලෙස ප්‍රකාශ කළ යුතු ය.

12. අභියාචනයට අදාලව යම් නීතිමය විරෝධතාවයක් පවතින්නේ නම් ඒ විරෝධතාවය පිළිබඳව සියල්ලටම පෙරාතුව හෝ එය හෙළිදරව් වීමෙන් පසුව ඉතා ඉක්මනින් ප්‍රමාදයකින් තොරව මණ්ඩලයට දැනුම්දිය යුතු ය.

13. අභියාචනා මණ්ඩලය විසින් සුදුසු යැයි සිතන්නේ නම් නීතිමය විරෝධතා වෙන වෙනම ලිඛිත හෝ වාචික දේශන සමග සලකා බැලිය හැකි ය.

14. (i) අභියාචනයක් යොමු කරමින් පවතින අවස්ථාවක, මණ්ඩලය විසින් එහි නිසි නීතිමය පදනමක් හෝ අධිකරණ බලයක් නොමැති බව හෝ රටේ රීතිවලට නියෝගවලට සහ නීතිවලට එරෙහි වීමක් ඇති බව සිතන්නේ නම් කැඳවන පළමු දිනයේ දී ම අභියාචනය කැඳවීමෙන් තොරව පළමු අවස්ථාවේදී ම අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලයට බලය පැවරී ඇත. මණ්ඩලය විසින් ඉහත සඳහන් කරන ලද හේතු මත අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන්නේ නම් මණ්ඩලය විසින් හේතු දැක්වීමක් සමඟ ප්‍රතික්ෂේප කිරීමේ තීරණය පිළිබඳ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව හා අභියාචක දැනුවත් කළ යුතු ය.

(ii) මණ්ඩලය විසින් අභියාචනය සම්බන්ධයෙන් ඒකාන්ත නියමයක් ප්‍රකාශයට පත් කරන අවස්ථාවක දී අභියාචක ඇතුළු සියලු පාර්ශවයන් ලියවිල්ලකින් දැනුවත් කිරීමට මණ්ඩලය විසින් පියවර ගත යුතු ය. නියමයේ එවැනි නිගමනයකට එළඹීම සඳහා බලපෑ හේතු ඇතුළත් කළ යුතු අතර ඒ නියමය ලියාපදිංචි තැපෑලෙන් අදාළ පාර්ශව වෙත යැවිය යුතු ය.

15. මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය මත ඉංජිනේරු සභාවේ අරමුදලින් සුදුසු පාරිශ්‍රමික ගෙවීමට අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් හිමිකම් ලබයි.

16. මෙම නියෝගවල :-

පනත යනුවෙන්, 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත අදහස් වේ.

"අභියාචන මණ්ඩලය" හෝ "අභියාචන මණ්ඩල" නැතහොත් "මණ්ඩලය" යන්නෙන්, 2017 අංක 4 දරන පනත යටතේ පිහිටුවන ලද අභියාචන මණ්ඩලය අදහස් වේ.

2017 අංක 4 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව යන්නෙන්, "ඉංජිනේරු සභාව" හෝ "සභාව" හෝ "ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව" නැතහොත් " ශ්‍රී ලංකාවේ ඉංජිනේරු සභාව" අදහස් වේ.

EOG 02 - 0144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.